ඉඩම් කොම ... ී ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணை ... ார் நாயகத்தின் திணைக்களம்
LAND COMM ... NER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් ලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla

011 279 7400
011 286 4051

මගේ අංකය / My No. LCGD/AD/7/7/1 (2020)  ඔබේ අංකය / Your No.  දිනය / Date 2020.02.26

චක්‍රලේඛ අංක 2020/1

සියළුම ප්‍රාදේශීය ලේකම්වරු

සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරු

ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්වරු (අන්තර් පළාත්)

**ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත්කර ඇති අවසර පත්‍ර සඳහා දීමනාපත්‍ර සකස් කිරීම**

උක්ත ශීර්ෂය යටතේ මා විසින් නිකුත් කර ඇති අංක 2013/02 හා 2014/09 චක්‍රලේඛ මෙමගින් අවලංගුකර එම චක්‍රලේඛ ඒකාබද්ධ කර පරිශීලනයේ පහසුව සඳහා සැහැදිලි කිරීම් සහිතව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර ලබාදීමේදී ඊට අනුකූලව නිකුත් කර ඇති බලපත්‍රයේ දැක්වෙන ඉඩමේ ප්‍රමාණය සහ දීමනාපත්‍රය සඳහා සකස් කරන රේඛා චිත්‍රයේ දැක්වෙන ප්‍රමාණය එකිනෙකට නොගැලපෙන අවස්ථා බොහෝමයක් ඇති බව හඳුනාගෙන ඇත.

මෙම දෝෂය නිසා දීමනාපත්‍රය සකස් කිරීමේ කටයුතු ප්‍රමාද වන අතර මා වෙත ලැබෙන ඉල්ලීම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් ආපසු හරවා යැවීමට ද සිදු වේ. මෙම තත්ත්වය යටතේ දීමනාපත්‍ර සකස් කිරීමේ දී නිශ්චිත පොදු ප්‍රතිපත්තියක් මත ක්‍රියා කිරීම සුදුසු බව හැඟී යන බැවින් පහත පරිදි කටයුතුකර දීමනාපත්‍ර සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු එවීමට පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වා සිටිමි.

01. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය බලපත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණයට වඩා වැඩිවන අවස්ථාවලදී, පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

I. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය අතර වෙනස 10% නොඉක්මවන අවස්ථාවලදී එම වෙනස පර්චස් 10කට වඩා වැඩි නොවේ නම් භුක්ති විඳින ඉඩම් ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබාගෙන දීමනාපත්‍රය සකස් කළ යුතු වේ.

II. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය අතර වෙනස 10% නොඉක්මවයි නම්, එම වෙනස පර්චස් 10කට වඩා වැඩි වේ නම්, එම වැඩිවන ඉඩම් ප්‍රමාණය වෙනම බිම් කැබැල්ලක් ලෙස වෙන් කළ යුතු අතර බලපත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබාගෙන දීමනාපත්‍රය සකස් කළ යුතු වේ.

පරිපාලන / நிர்வாகம் / Admin 011 279 7479 / 011 287 5033 | ගිණුම් / கணக்குகள் / Accounts 011 287 5833 / 011 286 4462 | ඉඩම් I / காணி I / Land I 011 287 4025 / 011 288 3812 | ඉඩම් II / காணி II / Land II 011 287 5834 / 011 287 3110 | ඉඩම් III / காணி III / Land III 011 279 7482 / 011 288 3...
විද්‍යුත් තැපෑල E-mail - landcom@landcomdept.gov.lk   වෙබ් ලිපිනය Web Address - www.landcom...gov...

III. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය අතර වෙනස 10% ඉක්මවන අවස්ථාවලදී බලපත්‍රයේ සඳහන් ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබාගෙන දීමනාපත්‍රය සකස් කළ යුතු වේ. එහෙත් මෙම වැඩි වූ ප්‍රමාණය ඉඩම පිහිටි පළාත් පාලන බල ප්‍රදේශයේ අවම බෙදුම් සීමාවට වඩා අඩු වේ නම් භුක්ති විඳින ඉඩම් ප්‍රමාණයටම දීමනාපත්‍රය සකස් කළ හැකිය.

02. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය බලපත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණයට වඩා අඩුවන අවස්ථාවලදී, පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

I. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය අතර වෙනස 10% නොඉක්මවන අවස්ථාවලදී, භුක්ති විඳින ඉඩම් ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබාගෙන දීමනාපත්‍රය සකස් කළ යුතු වේ.

II. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය අතර වෙනස 10% ට වඩා වැඩි වේ නම් භුක්ති විඳින ප්‍රමාණයට බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය සංශෝධනය කළ යුතු වේ. ප්‍රාදේශීය ලේකම් හෝ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස් බලපත්‍රයේ අදාල සංශෝධන සිදුකර භුක්ති විඳින ඉඩම් ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබාගෙන දීමනාපත්‍රය සකස් කළ යුතු වේ.

03. තවද 2014.01.01 දිනට පෙර මිනින්දෝරුවරු විසින් මෙම ප්‍රමාණයේ වෙනස 10% නොඉක්මවන අවස්ථාවලදී සහ එම වෙනස 10% තුළ පැවතියද ප්‍රමාණය පර්චස් 10ට වැඩිවීම වැනි හේතු නිසා භුක්ති විඳින ප්‍රමාණයටම මැන ඇත්නම් එවැනි අවස්ථා වලදී නැවත මැනුමක් අවශ්‍ය නොවන අතර භුක්ති විඳින ප්‍රමාණයට මැන ඇති රේඛා චිත්‍ර මත දීමනාපත්‍ර සකස් කළ යුතු වේ.

04. එසේම ඉහත පරිදි ප්‍රමාණයේ වෙනස 10% ඉක්මවනා ලෙස මැන ඇත්නම් එවැනි දෝෂ නිවැරදි කළ යුතු හෙයින් ඉහත 01,02 පරිදිම කටයුතු කළ යුතු වේ.

05. වාරි පහසුකම් සහිත මඩ ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ඉහත උපදෙස්වලට අමතරව පහත සඳහන් කරුණු කෙරෙහි ද සැලකිල්ලක් දැක්විය යුතුයි.

I. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය, බලපත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා අඩු වන අවස්ථාවල දී එම ඉඩම සඳහා නියමිත ජල පහසුකම් තිබේ නම් පමණක් භුක්ති විඳින ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබාගෙන දීමනා පත්‍රය සකස් කළ යුතු වේ.

II. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය, බලපත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා වැඩි වන අවස්ථාවල දී එම වැඩිවන ප්‍රමාණය රූඩ 02 කට වඩා අඩු වේ නම් භුක්ති විඳින ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබාගෙන දීමනාපත්‍රය සකස් කළ යුතු වේ.

III. භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය බලපත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා වැඩි වන අවස්ථාවල දී එම වැඩිවන ප්‍රමාණය රූඩ 02 කට වඩා වැඩි වේ නම් භුක්ති විඳින ප්‍රමාණයට රේඛා චිත්‍රයක් ලබාගෙන දීමනාපත්‍රය සකස් කළ යුතු වේ. එසේ වැඩිවන බිම් ප්‍රමාණය ඉවත්කර මැනීමට කටයුතු කළ යුතු අතර එම බිම් ප්‍රමාණය සඳහා නියමිත ජල පහසුකමක් ලබාගත හැකි වන පරිදි මැනුම් කිරීම සඳහා හැකි සෑම අවස්ථාවකදීම කටයුතු කළ යුතු වේ.

- මෙම උපදෙස්වලට පටහැනි වන අයුරින් රේඛා චිත්‍ර සකස්කර ඇති අවස්ථාවලදී, නැවත මැනුම් ඉල්ලීම් යවා එම රේඛා චිත්‍ර නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු වේ.
- ඉහත උපදෙස් පිළිපැදීමේදී යම් ගැටළුවක් මතු වේ නම් ඒ සම්බන්ධයෙන් මා අමතන ලෙස වැඩිදුරටත් දන්වමි.

ආර්.එම්.සී.එම්.හේරත්
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :-

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කරු. දැ.ගැ.ස.
2. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
3. මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව - මෙම උපදෙස් අනුව කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කිරීම සඳහා
4. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය